## ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
## කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1)244-9070

ඉ-තැපැල: o'hararm@state.gov http: //srilanka.usembassy.gov

Release No: 20160921

**තෙල් වැගිරීම් කළමනාකරණය සම්බන්ධයෙන්**
**එක්සත් ජනපද පැසිෆික් බල ඇණිය, ශ්‍රී ලංකාව හා මාලදිවයින සමග එක් ව කටයුතු කරයි.**

**සැප්තැම්බර් 21, 2016:** දේශීය පරිසරයට හා සංචාරක ව්‍යාපාරයට දැඩි අයහපත් බලපෑමක් එල්ල විය හැකි තෙල් වැගිරීමේ තත්වයකට සූදානම් වීම හා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ නිලධාරීන්ට එක්සත් ජනපද පැසිෆික් බල ඇණියේ විශේෂඥයින් විසින් ආපදා ප්‍රතිචාර පුහුණුවක් ලබා දුන්නේ ය. මෑත දී සිදු වූ තෙල් වැගිරීම්වල අත්දැකීම් හුවමාරු කර ගත් හමුදා හා සිවිල් නිලධාරීන්ට මුහුදේ පැවැත්වූ සජීව ප්‍රදර්ශනාත්මක අභ්‍යාසයකට ද සහභාගි වීමට අවස්ථාවක් ලැබුණි.

ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති වන අතුල් කෙෂාප් ප්‍රකාශ කළේ "කලාපීය සහයෝගිතාව දියුණු කිරීම වැදගත් වීමට එක් හේතුවක් වන්නේ ඉන්දියානු සාගර කලාපයේ යහපැවැත්ම ආරක්ෂා කිරීම" බවයි. "අපේ මුහුදු දිගටම ආහාර හා රැකියා ලබා දෙන බව සහතික කිරීමට ශ්‍රී ලංකාවත් මාලදිවයිනත් සමග එක්සත් ජනපදය එක් ව ක්‍රියා කරනු ඇත"

සතියක් පුරා පැවති වැඩමුළුවට එක්සත් ජනපද පැසිෆික් බල ඇණිය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂකයන්, ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, සමුද්‍ර පරිසර ආරක්ෂක අධිකාරිය, හා මාලදිවයිනේ ජාතික ආරක්ෂක හමුදා වල නියෝජිතයෝ සහභාගී වූහ අපේ සමුද්‍ර හා ඒවායේ සම්පත් ආරක්ෂා කිරීමත් සංරක්ෂණය කිරීමත් සඳහා ගත යුතු ක්‍රියා මාර්ග හා විසඳුම් සෙවීමට පරිසර ක්‍රියාකාරීන්, විද්‍යාඥයින්, ව්‍යාපාරිකයන් හා ලෝක නායකයන් එක් වූ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 'අපේ සමුද්‍ර සම්මේලනය' ද මෙයට සමගාමීව වොෂින්ටන් හි පවත්වන ලදී. (http://ourocean2016.org/)